**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2020**
**பொதுக்கலைத் தேர்வு (வெளிவாரி – பழைய பாடத்திட்டம்) - 2020**
**Bachelor of Arts (External - Old Syllabus) Examination - 2020**

**SSG I: සමාජ විද්‍යාවේ න්‍යාය හා ක්‍රමවේදය/ Theory and Method in Sociology**

කාලය පැය **03** යි.
மூன்று (03) மணித்தியாலங்கள்
Time allowed **03** Hours .

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Candidate will be penalized for illegible handwriting.

ප්‍රශ්න **04** පමණක් පිළිතුරු සපයන්න.
**04** வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer **04** questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **08** කි.
இந்த வினாப்பத்திரத்தில் **08** வினாக்கள் உள்ளன.
There are **08** questions in this question paper.

---

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙක (02)කින් යුක්තවේ. එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගන්න.

## පළමු කොටස

## සමාජ විද්‍යා න්‍යාය

01 සමාජ විද්‍යාව ආරම්භවීමට කාර්මික විප්ලවය බලපාන ලද ආකාරය විස්තර කරන්න.

02 සමාජ විද්‍යාව ස්වාධීන විෂයයක් ලෙස වර්ධනය වීමට එමිල් දුර්කයිම්, මැක්ස් වේබර් හා කාර්ල් මාර්ක්ස්ගෙන් සිදු වූ දායකත්වය සාකච්ඡා කරන්න.

03 කෘත්‍යවාදයට බී. මැලිනොවොස්කි සහ ආර්. බ්‍රවුන්ගෙන් සිදු වූ සම්මාදම විවේචනාත්මකව අගයන්න.

04 පහත කරුණු වලට අවධානය යොමු කරමින් "ගැටුම් න්‍යාය" පිළිබඳ රචනයක් ලියන්න.

(නිර්වචන, මූලික තර්කය, දුර්වලතා හා වැදගත්කම, දායකවූවන්, සම්මුති න්‍යායන් සමග ඇති සමානකම් හා වෙනස්කම්)

## දෙවන කොටස

## සමාජ විද්‍යාවේ ක්‍රමවේදය

05 ගුණාත්මක පර්යේෂණ ශිල්ප ක්‍රමවල වාසි හා අවාසි සාකච්ඡා කරන්න.

06 සමාජ පර්යේෂණ යනු කුමක්දැයි පැහැදිලි කර සමාජ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සමාජ පර්යේෂණවල වැදගත්කම විස්තර කරන්න.

07 සමාජ පර්යේෂණවලදී පර්යේෂකයෙකු සැලකිලිමත් වියයුතු කරුණු මොනවාද?

08 ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල කොවිඩ්- 19 වසංගතය පැතිරීම වැලැක්වීම සඳහා සුදුසු පර්යේෂණ යෝජනාවලියක් සකස් කරන්න.

**********************

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 25 බැගිනි )

**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2020**

**பொதுக்கலைத் தேர்வு (வெளிவாரி – பழைய பாடத்திட்டம்) - 2020**

**Bachelor of Arts (External - Old Syllabus) Examination - 2020**

**SSG II: ව්‍යවහාරික සමාජ විද්‍යාව/Applied Sociology**

කාලය පැය 03 යි.
மூன்று 03 மணித்தியாலங்கள்
Time allowed 03 Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Candidate will be penalized for illegible handwriting.

ප්‍රශ්න 04 පමණක් පිළිතුරු සපයන්න.
04 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer 04 questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 07 කි.
இந்த வினாப்பத்திரத்தில் 07 வினாக்கள் உள்ளன.
There are 07 questions in this question paper.

---

01 "ව්‍යවහාරික සමාජ විද්‍යාඥයා ධනාත්මක සමාජ වෙනසක් සඳහා මැදිහත්වේ". ව්‍යවහාරික සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විභාග කරන්න.

02 සංවර්ධන ව්‍යාපෘතියක මූලික අදියරේ දී සමාජ බලපෑම් තක්සේරුවක් කිරීමේ වැදගත්කම පහදන්න.

03 දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහනක් වශයෙන් සමෘද්ධි වැඩසටහන විමර්ශනය කර දෙන ලෙස ඔබගෙන් ඉල්ලා ඇතැයි සිතන්න. ඒ අනුව සමෘද්ධි වැඩසටහනේ ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා ඔබ කරන යෝජනාවන් විස්තර කරන්න.

04 ව්‍යාපෘති යෝජනාවලියක මූලිකාංග පැහැදිලි කරන්න.

05 ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව සහ උපාධිධාරීන් සඳහා රැකියා ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය විවේචනාත්මකව විභාග කරන්න.

06 ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සමාජ ආරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

07 සංවර්ධන සැලසුම්කරණයේදී ප්‍රජා සහභාගීත්වය ලබාගැනීමේ වැදගත්කම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

**********************

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 25 බැගින් )

**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2020**
**பொதுக்கலைத் தேர்வு (வெளிவாரி – பழைய பாடத்திட்டம்) - 2020**
**Bachelor of Arts (External - Old Syllabus) Examination - 2020**

**SSG III: දකුණු ආසියාව පිළිබඳ සමාජ විද්‍යාව/Sociology of South Asia**

කාලය පැය 03 යි.
மூன்று (03) மணித்தியாலங்கள்
Time allowed 03 Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Candidate will be penalized for illegible handwriting.

ප්‍රශ්න 04 පමණක් පිළිතුරු සපයන්න.
04 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer 04 questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
இந்த வினாப்பத்திரத்தில் 08 வினாக்கள் உள்ளன.
There are 08 questions in this question paper.

---

01 දකුණු ආසියාව පිළිබඳ අධ්‍යයනයේදී "ගැමි සමාජ ආකෘතියේ" ඇති අදාලත්වය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

02 "ඥාතිත්වය දකුණු ආසියානු සමාජවල දේශපාලනයේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි " සාකච්ඡා කරන්න.

03 සිංහල විවාහ ක්‍රමයේ වර්තමාන ප්‍රවණතාවන් පිළිබඳව විවේචනාත්මක රචනයක් ලියන්න.

04 පහත මාතෘකාවලින් ඕනෑම **තුනක්** පිළබඳව කෙටි සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රම
ii. මහා සම්ප්‍රදාය හා චුල සම්ප්‍රදාය
iii. සංස්කෘතකරණය
iv. දකුණු ආසියාවේ කාන්තාව
v. විස්තෘත පවුල

05 "සියළුම දකුණු ආසියාතික සමාජවල සමාන වර්ගයේ සමාජ ගැටලු දක්නට ලැබේ " ඔබ මෙම කියමන සමඟ කොතරම් දුරට එකඟ වන්නේද? සාකච්ජා කරන්න.

06 ශ්‍රී ලංකාවේ ගැමි කෘෂිකාර්මාන්තය යාන්ත්‍රියකරනය වීමේ සමාජීය ප්‍රතිඵල කවරේද?

07 නාගරීකරනය නිසා ශ්‍රී ලංකා සමාජය මුහුණු දෙන ගැටලු පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

08 දකුණු ආසියාව සංස්කෘතික කලාපයක් වන්නේ කවර අරුතකින්ද?

**********************

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 25 බැගිනි )